ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි : 01/2018

මගේ අංකය : PA/CS/POLICY/ව්‍යා.සංශෝධන

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

කොළඹ 07.

2018.03.06

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ දෙවන ශ්‍රේණියට උසස් කිරීම</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක.1840/34 හා 2013.12.11 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2013.04.02 දින සිට ක්‍රියාත්මක වූ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10 වගන්තිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය යටතේ වන 10.1.1.1 අනුවගන්තියේ vi දරණ උප වගන්තිය අනුව එම සේවයේ III ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම අපේක්ෂකයන් විසින් සපුරාලිය යුතු සුදුසුකමක් බව දැක්වේ.

02. එබැවින් 2007.07.01 දිනට පසු රාජ්‍ය කළමණාකරණ සහකාර III ශ්‍රේණියට පත්වීම් ලද නිලධාරීන් සාමාන්‍ය කාර්ය සාධනය මත II ශ්‍රේණියට උසස්වීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇති බවට සනාථ කෙරෙන ලිපියේ සහතික කළ පිටපතක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු බව කාරුණිකව දන්වමි.

03. උසස් වීම් කටයුතුවලදී සිදුවන අනවශ්‍ය ලිපි හුවමාරුව සහ ප්‍රමාදයන් වැළැක්වීම සඳහා අත්‍යවශ්‍ය වන මෙම කාරණය සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන ලෙසද වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

කේ.වී.පී.එම්.ජේ.ගමගේ

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්